# සතිපතා ආර්ථික දර්ශක



## 2024 පෙබරවාරි 02

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2023 දෙසැම්බර් මාසයේ වාර්තා වූ සියයට 4.0හි සිට 2024 ජනවාරි මාසයේ දී සියයට 6.4 දක්වා ඉහළ ගියේය. තවද, ආහාර උද්ධමනය සියයට 3.3 ක් ලෙස වාර්තා වූ අතර ආහාර නොවන උද්ධමනය සියයට 7.9ක් ලෙස වාර්තා විය. එමෙන්ම කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය, 2023 දෙසැම්බර් මාසයේ පැවති සියයට 0.6හි සිට 2024 ජනවාරි මාසයේ දී සියයට 2.2 දක්වා ඉහළ ගියේය.

2023 දෙසැම්බර් මාසයේ දී, පෙර මාසයට සාපේක්ෂව ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල පහත වැටීමක් පෙන්නුම් කරමින්, ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ලෙස හඳුන්වනු ලබන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය 48.6ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

සලකා බලන කාලපරිච්ඡේදය (2024.01.27 සිට 2024.02.02 දක්වා කාලය) තුළ දී බොරතෙල් මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. චීනයේ ආර්ථික ක්‍රියාකාරකම් පහළ මට්ටමක පැවතීම නිසා බොරතෙල් ඉල්ලුම අවිනිශ්චිත වීම සහ මැදපෙරදිග භූ-දේශපාලන ආතති ළිහිල්වනු ඇතැයි අපේක්ෂා කිරීම මිල ගණන් පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. සමස්තයක් ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි දෙවර්ගයේ ම බොරතෙල් බැරලයක මිල ගණන්, එක්සත් ජනපද ඩොලර් 4.00ට වඩා වැඩි අගයකින් පහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2024 පෙබරවාරි මස 02 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 34කින් සියයට 11.91ක් දක්වා පහළ ගියේය.

2023 දෙසැම්බර් මාසයේ දී පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සියයට 7.3ක් විය.

2023 දෙසැම්බර් මාසයේ දී බැංකු පද්ධතිය මගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 562.5කින් ඉහළ ගියේය.

රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණය 2023 දෙසැම්බර් මාසයේ දී රුපියල් බිලියන 355.6කින් පහළ ගියේය.

පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණය 2023 දෙසැම්බර් මාසයේ දී රුපියල් බිලියන 102.6කින් ඉහළ ගියේය.

වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ යන ලදී.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 43.151ක හිඟයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 36.609ක හිඟයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2024 පෙබරවාරි මස 02 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 0.92කින් දර්ශක අගය 10,430.79ක් දක්වා ඉහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 0.48කින් දර්ශක අගය 2,943.03ක් දක්වා ඉහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

මෙම සතිය තුළ දී, භාණ්ඩාගාර බිල්පත් සහ වසර 08කට වැඩි කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර හැර අනෙකුත් භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතවල සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි.

පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය සියයට 1.63ක වැඩි වීමක් පෙන්නුම් කර ඇත.

මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වෙන්දේසි සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් පිළිවෙලින් 2.54 සහ 4.46 ගුණයකින් වැඩි විය.

පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය සියයට 21.85ක ප්‍රතිශතයකින් ඉහළ යාමක් දක්නට ලැබේ.

## විදේශීය අංශය

2024 වසරේ පෙබරවාරි 02 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 3.2කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකවල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 6.8කින්, ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 3.1කින්, යූරෝවලට සාපේක්ෂව සියයට 5.1කින් සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 2.9කින් අතිප්‍රමාණය විය.

2023 වසරේ දෙසැම්බර් මස අවසානයට දළ නිල සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 4,392ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. එ.ජ. ඩොලර් බිලියන 1.4කට පමණ සමාන වූ චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් මෙහි අන්තර්ගත වන අතර, එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.

2023 වසර තුළ දී අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිලියන 11,911ක් දක්වා සියයට 9.1කින් පහළ ගිය අතර, මේ සඳහා අපනයන කාණ්ඩ අතරින් රෙදිපිළි හා ඇඟලුම් (සියයට -18.0), රබර් නිෂ්පාදිත (සියයට -7.7), පොල් ආශ්‍රිත නිෂ්පාදිත (සියයට -15.9), රසායනික නිෂ්පාදිත (සියයට -13.4) සහ ඛනිජ තෙල් නිෂ්පාදිත (සියයට -5.0) අපනයන ආදායම පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. 2023 වසර තුළ දී ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිලියන 16,811ක් දක්වා සියයට 8.1කින් පහළ ගිය අතර, ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග (සියයට -22.6), ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (සියයට -72.8), ඉන්ධන (සියයට -4.0) සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (සියයට -27.1) ආනයන පහළ යෑම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2023 වසර තුළ දී වෙළඳ හිඟය, 2022 වසර තුළ දී වාර්තා වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 5,185ක සිට එක්සත් ජනපද ඩොලර් මිලියන 4,900ක් දක්වා පහළ ගියේය.

සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩයන්හි අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 4.3කින් පහළ ගියේය. 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 10.0කින් පහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන මිල ගණන් පහළ යෑම හේතු විය. මේ අනුව, 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 88.5ක් දක්වා සියයට 6.3කින් ඉහළ ගියේය.


තේ සඳහා වෙන්දේසි මිලෙහි සාමාන්‍යය (කොළඹ තේ වෙන්දේසියෙහි මිල) 2022 වසරේ දෙසැම්බර් මාසයේ පැවති කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 4.05 සිට 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 3.66ක් දක්වා පහළ ගියේය. 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී බොරතෙල් සඳහා වූ ආනයන මිලෙහි සාමාන්‍යය, බැරලයකට එක්සත් ජනපද ඩොලර් 97.62ක් දක්වා සියයට 0.6කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඉහළ ගියේය.


# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක

| ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100) | 2022 | 2023 | |
|---|---|---|---|
| | දෙසැ. | නොවැ. | දෙසැ. |
| මතුපිට උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 200.4 | 206.0 | 208.8 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.0 | 1.2 | 1.4 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | - | 16.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | - | 2.8 | 4.2 |
| මූලික උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 188.0 | 189.3 | 189.7 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | - | 15.8 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | - | 0.8 | 0.9 |

| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) | 2023 | | 2024 |
|---|---|---|---|
| | ජන. | දෙසැ. | ජන. |
| මතුපිට උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 188.6 | 195.1 | 200.7 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.5 | 0.9 | 2.9 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 17.4 | 14.2 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 51.7 | 4.0 | 6.4 |
| මූලික උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 172.4 | 172.5 | 176.2 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 14.5 | 11.3 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 45.6 | 0.6 | 2.2 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 206.80 | 234.00 | 238.00 | 238.00 | 225.00 | 250.00 | 255.00 | 255.00 |
| රතු කැකුළු | 180.20 | 179.60 | 175.50 | 173.80 | 200.00 | 200.00 | 200.00 | 200.00 |
| බෝංචි | 330.00 | 487.50 | 737.50 | 640.00 | 380.00 | 537.50 | 787.50 | 700.00 |
| ගෝවා | 52.00 | 445.00 | 537.50 | 566.00 | 86.00 | 495.00 | 587.50 | 620.00 |
| කැරට් | 132.00 | 712.50 | 1,175.00 | 1,220.00 | 176.00 | 762.50 | 1,275.00 | 1,320.00 |
| තක්කාලි | 178.00 | 575.00 | 575.00 | 620.00 | 220.00 | 650.00 | 625.00 | 670.00 |
| වට්ටක්කා | 92.00 | 150.00 | 145.00 | 190.00 | 124.00 | 200.00 | 195.00 | 240.00 |
| පතෝල | 188.00 | 190.00 | 400.00 | 362.00 | 238.00 | 240.00 | 450.00 | 420.00 |
| වම්බටු | 126.00 | 537.50 | 625.00 | 550.00 | 172.00 | 587.50 | 675.00 | 600.00 |
| අමු මිරිස් | 250.00 | 1,175.00 | 887.50 | 1,120.00 | 300.00 | 1,275.00 | 975.00 | 1,220.00 |
| දෙහි | 82.00 | 200.00 | 150.00 | 134.00 | 114.00 | 250.00 | 200.00 | 200.00 |
| රතු ළූණු ( දේශීය) | 465.00 | 500.00 | ලැ.නො. | 350.00 | 550.00 | 550.00 | ලැ.නො. | 400.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 127.00 | 386.60 | 368.25 | 309.20 | 160.00 | 450.00 | 430.00 | 400.00 |
| අර්තාපල් ( දේශීය) | 329.80 | 357.20 | 324.00 | 324.20 | 380.00 | 400.00 | 400.00 | 360.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 1,275.20 | 1,015.00 | 950.00 | 950.00 | 1,470.00 | 1,100.00 | 1,100.00 | 1,100.00 |
| රතු පරිප්පු | 347.00 | 300.00 | 299.25 | 300.00 | 375.00 | 315.00 | 320.00 | 320.00 |
| බිත්තර-සුදු ( ඒකක මිල) | 43.00 | 48.00 | 52.75 | 55.80 | 44.00 | 48.50 | 53.25 | 56.30 |
| පොල් ( ගෙඩියක මිල) | 96.80 | 90.00 | 90.00 | 90.00 | 120.00 | 120.00 | 120.00 | 120.00 |

### 1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 197.00 | 231.80 | 231.00 | 226.20 |
| සුදු කැකුළු | 177.60 | 197.00 | 197.00 | 192.80 |
| රතු කැකුළු | 197.00 | 186.80 | 185.25 | 181.80 |
| නාඩු | 187.00 | 203.00 | 198.25 | 194.60 |

ලැ.නො. - ලැබී නොමැත.


## 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 230.00 | 260.00 |
| රතු කැකුළු | 180.00 | 180.00 |
| බෝංචි | 687.50 | 571.00 |
| ගෝවා | 385.00 | 470.00 |
| කැරට් | 1,087.50 | 1,060.00 |
| තක්කාලි | 488.75 | 556.00 |
| වට්ටක්කා | 122.50 | 200.00 |
| පතෝල | 285.00 | 308.00 |
| වම්බටු | 443.75 | 469.00 |
| අළු කෙසෙල් | 266.25 | 279.60 |
| රතු ළූණු ( දේශීය) | ලැනො. | ලැනො. |
| රතු ළූණු ( ආනයනික) | 333.75 | 224.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 349.50 | 322.00 |
| අර්තාපල් (දේශීය) | 275.00 | 265.00 |
| අර්තාපල් ( ආනයනික) | 164.50 | 159.80 |
| වියළි මිරිස් ( ආනයනික) | 887.50 | 856.00 |
| පොල් ( ගෙඩියක මිල) | 77.00 | 79.20 |


## 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | ලැනො. | ලැනො. |
| රතු කැකුළු | 190.00 | 190.00 |
| බෝංචි | 825.00 | 800.00 |
| ගෝවා | 775.00 | 716.00 |
| කැරට් | 1,450.00 | 1,540.00 |
| තක්කාලි | 675.00 | 820.00 |
| වට්ටක්කා | 220.00 | 284.00 |
| පතෝල | 520.00 | 472.00 |
| වම්බටු | 800.00 | 780.00 |
| අමු මිරිස් | 1,150.00 | 1,340.00 |
| රතු ළූණු ( දේශීය) | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු ( ආනයනික) | 420.00 | 376.00 |
| අර්තාපල් ( දේශීය) | 600.00 | 520.00 |
| අර්තාපල් ( ආනයනික) | 180.00 | 220.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 1,100.00 | 1,060.00 |
| රතු පරිප්පු | 320.00 | 320.00 |
| සුදු සීනි | 290.00 | 290.00 |
| බිත්තර- සුදු ( එකක මිල) | 52.75 | 54.60 |
| පොල් ( ගෙඩියක මිල) | 122.50 | 130.00 |

### නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල











## 1.2.5 මාළු වෙළඳපොළ


| | පෑලියගොඩ | | මීගමුව | | නාරාහේන්පිට | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය |
| කෙලවල්ලා | 862.50 | 1,225.00 | 912.50 | 900.00 | 1,390.00 | 1,390.00 | 1,850.00 | 1,964.00 |
| බලයා | 550.00 | 750.00 | 650.00 | 750.00 | 830.00 | 930.00 | 806.67 | 990.00 |
| සාලයා | 300.00 | 412.00 | 287.50 | 336.00 | 440.00 | 486.00 | 450.00 | 524.00 |
| හුරුල්ලා | 687.50 | 860.00 | 675.00 | 756.67 | 860.00 | 930.00 | 983.33 | 1,090.00 |

ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | තෙවන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2021 (අ)(ආ) | 2022 (ආ) | 2022(අ)(ආ) | 2023 (ආ) |
| කෘෂිකාර්මික | 0.9 | (4.6) | (6.7) | 3.0 |
| කාර්මික | 5.7 | (16.0) | (21.3) | 0.3 |
| සේවා | 3.5 | (2.0) | (4.2) | 1.3 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු -සහනාධාර | (3.6) | (27.1) | (38.7) | 13.6 |
| දළ දේශීය නිෂ්පාදිතය | 3.5 | (7.8) | (11.5) | 1.6 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | නොවැම්බර් | | % වෙනස |
|---|---|---|---|
| | 2022 (අ) | 2023 (අ) | |
| තේ (කි.ග්‍රෑ. මිලියන) | 20.4 | 19.6 | (3.8) |
| රබර් (කි.ග්‍රෑ. මිලියන) | 5.0 | 3.5 | (29.9) |
| පොල් (ගෙඩි මිලියන) | 265.1 | 264.8 | (0.1) |

(අ) තාවකාලික





මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය

## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | නොවැම්බර් | | % වෙනස |
|---|---|---|---|
| | 2022 (ආ) | 2023 (ඇ) | |
| කාර්මික නිෂ්පාදන දර්ශකය | 81.0 | 89.7 | 10.8 |
| ආහාර නිෂ්පාදන | 83.3 | 91.9 | 10.3 |
| ඇඟලුම් නිෂ්පාදන | 96.5 | 85.9 | (11.0) |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 102.5 | 100.1 | (2.3) |
| පිරිපහදුකළ ඛනිජතෙල් නිෂ්පාදන | 1.5 | 106.2 | 6,871.8 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 83.1 | 80.9 | (2.6) |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 66.6 | 66.0 | (1.0) |
| පාන වර්ග | 134.7 | 131.1 | (2.7) |

(අ) ප්‍රධාන උප අංශ 7
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | 2022 | | 2023 | |
|---|---|---|---|---|
| | නොවැ. | දෙසැ. | නොවැ. | දෙසැ. |
| දර්ශකය | 42.1 | 44.8 | 57.0 | 52.7 |


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | 2022 | | 2023 | |
|---|---|---|---|---|
| | නොවැ. | දෙසැ. | නොවැ. | දෙසැ. |
| දර්ශකය | 49.0 | 51.6 | 59.4 | 58.9 |

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම් (අ) | 2022 | | 2023 | |
|---|---|---|---|---|
| | නොවැ. | දෙසැ. | නොවැ. | දෙසැ. |
| සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය | 30.3 | 32.9 | 44.3 | 48.6 |

(අ)ජාත්‍යන්තර ක්‍රමවේදය අනුගමනය කරමින්, ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය "ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය" ලෙස හඳුන්වන අතර, එය නිෂ්පාදන අංශයේ සහ සේවා අංශයේ මූලික දර්ශක හා සැසඳිය නොහැකි වේ.







## 1.7 සේවා නියුක්තිය [(අ)]

| අයිතමය | 2022 | 2023 කාර්තු:2 | 2023 කාර්තු:3 |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 49.8 | 48.6 | 48.8 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.7 | 5.2 | 4.7 |

**අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන්[(ආ)] (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)**


| | 2022 | 2023 කාර්තු:1 | 2023 කාර්තු:2 |
|---|---|---|---|
| කෘෂිකර්මාන්ත | 26.5 | 26.7 | 25.7 |
| කර්මාන්ත | 26.5 | 25.5 | 26.3 |
| සේවා | 47.0 | 47.8 | 48.1 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.8 වැටුප් ප්‍රමාණ දර්ශක


| අයිතමය | 2022 දෙසැ. | 2023 දෙසැ. | වෙනස % |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) - නාමික | 133.1 | 133.1 | 0.0 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100) - නාමික | 165.6 | 175.3 | 5.9 |
| කෘෂිකර්මාන්ත | 167.6 | 173.7 | 3.6 |
| කර්මාන්ත | 165.0 | 175.8 | 6.5 |
| සේවා | 164.7 | 176.2 | 7.0 |





## 1.9 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2023 ලං.ඛ.නි.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඇ) (ඈ) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2024 ලං.ඛ.නි.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 84.28 | 78.60 | 97.93 | 78.93 | 73.64 | |
| පෙබරවාරි | 83.52 | 76.97 | - | | | |
| මාර්තු | 78.93 | 73.05 | 84.05 | | | |
| අප්‍රේල් | 83.09 | 79.10 | 90.49 | | | |
| මැයි | 76.05 | 72.05 | 86.90 | | | |
| ජූනි | 74.85 | 70.13 | 90.90 | | | |
| ජූලි | 79.90 | 75.52 | 81.29 | | | |
| අගෝස්තු | 85.09 | 81.28 | 81.53 | | | |
| සැප්තැම්බර් | 91.89 | 88.72 | - | | | |
| ඔක්තෝබර් | 89.19 | 86.16 | 88.98 | | | |
| නොවැම්බර් | 82.22 | 77.58 | 99.98 | | | |
| දෙසැම්බර් | 77.53 | 72.36 | 97.62 | | | |

| දිනය | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| 27-01 | 87.74 | 81.21 | - | - |
| 28-01 | - | - | - | - |
| 29-01 | - | - | 83.85 | 78.71 |
| 30-01 | 87.10 | 80.17 | 82.78 | 77.12 |
| 31-01 | 85.18 | 78.02 | 82.50 | 77.58 |
| 01-02 | 84.49 | 79.07 | 81.71 | 76.33 |
| 02-02 | 83.38 | 77.00 | 79.32 | 74.32 |





මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1.10 දෛනික විදුලිබල උත්පාදනය

| | 2024-01-29 | 2024-01-30 | 2024-01-31 | 2024-02-01 |
|---|---|---|---|---|
| උපරිම ඉල්ලුම (මෙ. වො.) | 2,294.90 | 2,156.10 | 2,145.40 | 2,203.60 |
| මුළු උත්පාදනය (ගි. වො. පැ) | 45.13 | 45.11 | 44.82 | 44.41 |
| ජල | 16.17 | 16.07 | 18.71 | 18.58 |
| ගල් අඟුරු | 19.22 | 19.30 | 19.36 | 19.42 |
| තෙල් | 4.84 | 5.52 | 3.55 | 3.49 |
| සුළං | 2.45 | 1.61 | 0.71 | 0.43 |
| සූර්ය (තොග) | 2.17 | 2.18 | 2.19 | 2.06 |
| ජෛව ස්කන්ධය | 0.29 | 0.43 | 0.30 | 0.43 |




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය


(අ) කුටුම්භ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි
(ආ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ඇ) ලං.ඛ.නි.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නි.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නි.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2023 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.
(ඈ) තාවකාලික

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රතිපත්ති පොලී අනුපාතික | වසරකට පෙර | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 14.50 | 9.00 | 9.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 15.50 | 10.00 | 10.00 |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 15.43 | 9.11 | 9.12 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | |
| දින 91 | 29.91 | 13.35 | 11.97 |
| දින 182 | 28.72 | 13.41 | 12.20 |
| දින 364 | 27.72 | 12.78 | 12.00 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 24.82 | 12.25 | 11.91 |

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (සතිපතා සාමාන්‍යය)




| | 2022 දෙසැම්බර් | 2023 නොවැම්බර් | 2023 දෙසැම්බර් |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25 - 6.00 | 0.25 - 13.00 | 0.25 - 13.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 4.50 - 30.00 | 1.00 - 22.00 | 1.00 - 22.00 |

| | 2023 ජනවාරි | 2023 දෙසැම්බර් | 2024 ජනවාරි |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 14.63 | 11.64 | 11.15 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 19.15 | 14.88 | 14.28 |

| | 2022 දෙසැම්බර් | 2023 නොවැම්බර් | 2023 දෙසැම්බර් |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 23.07 | 11.54 | 10.55 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 23.73 | 11.82 | 10.80 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 18.70 | 14.66 | 14.21 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 26.20 | 15.17 | 14.38 |
| **ජාතික ඉතිරිකිරීමේ බැංකුව** | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 12.00 | 8.50 | 8.00 |


| භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය | වසර 02 මාස 10 2024 ජන. 30 | වසර 04 මාස 10 2024 ජන. 30 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 11.25 | 11.50 |
| බර තබන ලද සාමාන්‍ය එලදා අනුපාතිකය | 13.08 | 13.65 |


### බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව


| | සතියකට පෙර | මෙම සතිය | | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 12.10 | 12.37 | කාර්ගිල්ස් බැංකුව | 13.82 | 13.70 |
| මහජන බැංකුව | 11.52 | 11.74 | එච්එස්බීසී බැංකුව | 13.04 | 12.30 |
| හැටන් නැෂනල් බැංකුව | 11.69 | 12.11 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 11.84 | 11.99 |
| කොමර්ෂල් බැංකුව | 11.50 | 11.57 | සිටි බැංකුව | 11.95 | 12.10 |
| සම්පත් බැංකුව | 12.17 | 12.30 | ඩොයිෂ් බැංකුව | 12.81 | 11.50 |
| සෙලාන් බැංකුව | 13.41 | 13.83 | හබීබ් බැංකුව | 14.89 | 14.89 |
| යූනියන් බැංකුව | 11.69 | 11.97 | ඉන්දියන් බැංකුව | 13.39 | 14.38 |
| පැන් ඒෂියා බැංකුව | 11.70 | 12.46 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව | 12.89 | 12.89 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 11.77 | 12.02 | එම්සීබී බැංකුව | 12.89 | 12.89 |
| ඩීඑෆ්සීසී බැංකුව | 12.68 | 14.34 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 12.52 | 11.96 |
| එන්ඩීබී බැංකුව | 12.38 | 12.71 | පබ්ලික් බැංකුව | 14.03 | 14.02 |
| අමානා බැංකුව | 11.25 | 11.75 | බැන්ක් ඔෆ් චයිනා | - | - |

## 2.2 මුදල් සැපයුම

| | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | දෙසැම්බර් 2022[අ] | නොවැම්බර් 2023[අ] | දෙසැම්බර් 2023[ආ] | දෙසැම්බර් 2022[අ] | නොවැම්බර් 2023 [අ] | දෙසැම්බර් 2023 [ආ] |
| සංචිත මුදල් | 1,349.4 | 1,411.2 | 1,328.7 | 3.3 | 7.0 | -1.5 |
| පටු මුදල් සැපයුම (M1) | 1,453.6 | 1,507.0 | 1,658.0 | -0.4 | 3.4 | 14.1 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 10,497.1 | 11,243.6 | 11,485.1 | 8.9 | 7.9 | 9.4 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 12,289.6 | 12,929.5 | 13,189.1 | 15.4 | 6.3 | 7.3 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම්[ඇ] | -1,766.8 | -572.3 | -456.1 | -79.9 | 69.4 | 74.2 |
| මුදල් අධිකාරීන් | -1,613.9 | -887.1 | -837.3 | -316.7 | 45.9 | 48.1 |
| වාණිජ බැංකු | -153.0 | 314.8 | 381.2 | 74.3 | 236.6 | 349.3 |
| දේශීය බැංකු ඒකක (DBUs) | -433.5 | -320.7 | -262.5 | -13.6 | 38.7 | 39.4 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 280.5 | 635.5 | 643.8 | 231.6 | 117.0 | 129.5 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම්[ඇ] | 14,056.4 | 13,501.8 | 13,645.2 | 20.9 | -3.8 | -2.9 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ)[ඈ] | 7,471.1 | 7,722.5 | 8,285.0 | 28.1 | 5.9 | 10.9 |
| මහ බැංකුව | 3,432.5 | 2,317.4 | 2,376.2 | 63.9 | -31.2 | -30.8 |
| වාණිජ බැංකු | 4,038.6 | 5,405.1 | 5,908.8 | 8.0 | 37.8 | 46.3 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 3,639.3 | 5,174.8 | 5,689.3 | 8.3 | 47.9 | 56.3 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 399.3 | 230.4 | 219.4 | 5.9 | -45.6 | -45.1 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය [ඈ] | 1,749.7 | 1,125.4 | 769.8 | 47.3 | -36.1 | -56.0 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 1,689.4 | 1,067.0 | 712.3 | 73.7 | -37.2 | -57.8 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 60.3 | 58.4 | 57.5 | -72.0 | -6.1 | -4.7 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,411.5 | 7,263.9 | 7,366.4 | 6.2 | -3.1 | -0.6 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,732.3 | 6,737.8 | 6,834.8 | 3.6 | -1.0 | 1.5 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 679.1 | 526.1 | 531.6 | 40.7 | -24.5 | -21.7 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -2,575.8 | -2,609.9 | -2,776.0 | -8.6 | -3.6 | -7.8 |





## 2.3 සංචිත මුදල්හි සතිපතා වෙනස

| | 2024-01-24 | 2024-02-01 | වෙනස |
|---|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,344,877.28 | 1,511,301.51 | 166,424.23 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| ඒක්ෂණ මුදල් වෙළඳපොළ | 2024-01-29 | 2024-01-30 | 2024-01-31 | 2024-02-01 | 2024-02-02 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 9.11 | 9.13 | 9.10 | 9.14 | 9.10 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 13.45 | 8.10 | 0.78 | 11.25 | 9.60 |

| වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් | 2024-01-29 | 2024-01-30 | 2024-01-31 | 2024-02-01 | 2024-02-02 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 9.89 | 9.88 | 9.63 | 9.46 | 9.39 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 8.08 | 11.45 | 1.75 | 20.24 | 44.30 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| | 2024-01-29 | 2024-01-30 | 2024-01-31 | 2024-02-01 | 2024-02-02 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් බිලියන) | 2,756 | 2,756 | 2,756 | 2,756 | 2,756 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් බිලියන) | 1,624 | 1,630 | 1,632 | 1,639 | 1,606 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) අදාළව
(ඈ) රජය සතු තෝරාගත් වාණිජ ව්‍යාපාරවල ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ එකඟ වූ ක්‍රියාමාර්ගවලට අනුකූලව 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී.ඒ අනුව, මෙම ගැළපීම අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර එය අදාළ රාජ්‍ය බැංකුවේ ශේෂ පත්‍රයේ පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.

## 2.6 විවට වෙළඳ කටයුතු

| අයිතමය | 2024 ජන. 29 | 2024 ජන. 30 | 2024 ජන. 31 | 2024 පෙබ. 01 | 2024 පෙබ. 02 |
|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | 40.00 | 40.00 | 50.00 | 80.00 | 50.00 |
| කාල සීමාව (දින ගණන) | 1 | 1 | 1 | 1 | 3 |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | 32.91 | 35.37 | 47.63 | 77.03 | 38.50 |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | 32.91 | 35.37 | 47.63 | 77.03 | 38.50 |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 9.02 | 9.05 | 9.02 | 9.02 | 9.05 |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 9.25 | 9.25 | 9.25 | 9.50 | 9.30 |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | 9.17 | 9.16 | 9.20 | 9.21 | 9.11 |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | 30.00 | |
| පියවීමේ දිනය | | | | 02.02.2024 | |
| පරිණත වන දිනය | | | | 01.03.2024 | |
| කාල සීමාව (දින ගණන) | | | | 28 | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | 49.00 | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | 30.00 | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | 10.75 | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | 10.88 | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | 10.77 | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 7.994 | 5.250 | 30.401 | 11.800 | 183.450 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 17.320 | 7.416 | 8.118 | 14.813 | 17.059 |
| | | | | | |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | **(42.236)** | **(37.536)** | **(25.343)** | **(80.043)** | **127.891** |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)[අ]** | **(206.736)** | **(202.036)** | **(189.843)** | **(214.543)** | **(36.609)** |

(අ) සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම්/ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් සහ වාණිජ පත්‍රිකා නිකුතු

### 2.7.1 ණය කාඩ්පත්[අ]


| | 2022 දෙසැම්බර් | 2023 නොවැම්බර් | 2023 දෙසැම්බර් (ආ) |
|---|---|---|---|
| මුළු සක්‍රීය කාඩ්පත් ගණන | 1,952,991 | 1,913,000 | 1,917,085 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 13,028 | 10,913 | 10,768 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,939,963 | 1,902,087 | 1,906,317 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 143,098 | 145,197 | 151,373 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 37,328 | 34,822 | 35,838 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 105,770 | 110,375 | 115,534 |

### 2.7.2 වාණිජ පත්‍රිකා නිකුතු[ඇ]


| | 2022 දෙසැම්බර් | 2023 නොවැම්බර් | 2023 දෙසැම්බර් (ආ) |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) - රු. බිලියන (ඈ) | 2.0 | 0.8 | 1.3 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) - රු. බිලියන | 0.2 | 0.2 | 0.7 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික
(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව
(ඈ) වසරේ මේ දක්වා එකතුව

වාණිජ පත්‍රිකා නිකුතු (සමුච්චිත)





ණය කාඩ්පත් - නොපියවූ ශේෂය




## 2.8 කොටස් වෙළඳපොළ

| | 2023-02-03 | 2024-01-26 | 2024-02-02 |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ASPI) | 9,178.61 | 10,335.79 | 10,430.79 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) (S&P SL20) | 2,863.64 | 2,929.00 | 2,943.03 |
